

# 2 විද්‍යුත් පැතුරුම්පත්

මෙම ඒකකය හැදෑරීමෙන් ඔබට,

- පැතුරුම්පත් යනු මොනවා ද?
- පැතුරුම්පතක විශේෂ ලක්ෂණ
    - වැඩ පොත, වැඩ පත, කොටු, තීරුව, පේළිය
    - කොටු නාම
    - ශ්‍රිත, සූත්‍ර
    - මෙහෙයුම් කාරක
    - දත්ත තේරීම
    - ප්‍රස්තාර

පිළිබඳ අවබෝධයක් ලැබෙනු ඇත.

## 2.1 පැතුරුම්පත් යනු මොනවා ද?

පැතුරුම්පත් යනු අතීතයේ ගණකාධිකාරිවරුන් කඩදාසි භාවිතයෙන් ගණනය කිරීම් සඳහා යොදා ගන්නා ලද ක්‍රමවේද සඳහා වර්තමානයේ ඇති ඉලෙක්ට්‍රොනික ලේඛනයකි.

ශ්‍රිත (function) සහ සූත්‍ර (formula) යොදා ගනිමින් ගණනය (calculations) කිරීම් ද දත්ත තේරීම් ද (sorting), ප්‍රස්තාර (chart) නිර්මාණය කිරීම වැනි ගණිතමය සහ ගිණුම්කරණ කටයුතු සඳහා යොදා ගත හැකි තීරු (columns) සහ පේළි (row) වලින් සමන්විත වූ, ලේඛනයක් පැතුරුම්පතක් ලෙස හැඳින්විය හැකි ය.

පැතුරුම්පත් මෘදුකාංගයක් යොදා ගනිමින් පරිගණකයක් මගින් විද්‍යුත් පැතුරුම්පතක් නිර්මාණය කර ගත හැකි ය. පැතුරුම්පත් මෘදුකාංගය යෙදුම් මෘදුකාංගයකි.

විද්‍යුත් පැතුරුම්පතක ලේඛන සකස් කිරීම සඳහා වැඩ පොතක් (book) භාවිත වේ. එම වැඩ පොතෙහි, වැඩපත් (worksheet) මගින් ලේඛන සකස් කර ගත හැක. ලේඛන නිර්මාණයේ දී යොදා ගනු ලබන මෙවලම් රාශියක් ඇත. ඒවායෙහි කාර්යයන් හඳුනා ගනිමු.

## පොදු මෙවලම්


නව වැඩපතක් ලබා ගැනීම - New
තැන්පත් කළ ලේඛනයක් විවෘත කිරීමට - Open
ලේඛන මුද්‍රණය කිරීමට - Print
ලේඛනයක් තැන්පත් කිරීමට - Save
ලේඛනයක මුද්‍රණ පෙර දසුන බලා ගැනීම - Print Preview


කරන ලද ක්‍රියාවක් අවලංගු කිරීමට - Undo
අකුරු, පින්තූර ආදිය පිටපත් කිරීමට - Copy
පිටපත් කර ගත් හෝ කපා ගත් අකුරු, පින්තූර ආදිය ඇලවීමට - Paste
ABC
අවලංගු කරන ලද ක්‍රියාව නැවත කිරීමට - Redo
අකුරු, පින්තූර ආදිය කපා ගැනීමට - Cut
වචනවල සහ වාක්‍යවල අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ හරි වැරදි බැලීමට - Spelling

## පැතුරුම්පතක විශේෂ ලක්ෂණ

**නාම කොටුව - Name Box**
තෝරා ගන්නා කෝෂ නාමය පෙන්නුම් කරයි.

**තීරු - Column**
තීරුවකට ලේබලයක් ඇත. ඒවා ඉංග්‍රීසි හෝඩියේ A අක්ෂරයෙන් ආරම්භ වේ.

**සූත්‍ර තීරය - Formula Bar**
කෝෂයක යතුරුලියනය කරන දෙය පෙන්නුම් කරයි.

**පේළි - Row**
පේළියකට ලේබලයක් ඇත. ඒවා 1 සිට ආරම්භ වන ඉලක්කම් ය.




**කෝෂ පරාසය - Cell Range**
එක ළඟින් ඇති කෝෂ කිහිපයක් කෝෂ පරාසයක් නම් වේ.

**කෝෂය - Cell**
තීරුව සහ පේළිය එකතු වන ස්ථානය කෝෂයකි. තීරුවේ අකුර සහ පේළියේ අංකය කෝෂ නාමය **G7** (Cell Address) වේ.

## කෝෂ හැඩසව් කිරීමේ මෙවලම් - cell formatting tools




## එකෙල්ල කිරීම සහ ස්ථාන ගත කිරීමේ මෙවලම්
## alignment and positioning tools



## කෝෂයේ ඇති දත්ත වර්ගයට අනුව හැඩසවි කිරීමේ මෙවලම් - **number formating tools**

මුදල්
Currency

ප්‍රතිශතය
Percentage

දශම ස්ථාන අඩු වැඩි කිරීම
Increase & Decrease Decimals







- අංක - 10, 25, 100...
- මුදල් - Rs. / $ / ¥ - 10.00
- ගිණුම්කරණ - Rs. / $ / ¥ - 10.00
- කෙටියෙන් දින - 02 /25/2018 (MM / DD / YYYY)
- සවිස්තර ව දින - Tuesday, February 25, 2018
- වේලාව - 1:30 p.m, 10:00 a.m
- ප්‍රතිශතය - 23% , 45%, 75%
- භාග - 2/9, 4/5
- විද්‍යාත්මක - 5677=5.68E+03

## පැතුරුම්පත් භාවිත කරමින් සූත්‍රයක් හැඳින්වීමේ දී යොදා ගනු ලබන සලකුණු සහ වචන

### සූත්‍ර සඳහා සලකුණු - symbols for formulae

| සලකුණ | විස්තරය |
|---|---|
| = | සූත්‍ර හෝ ශ්‍රිත ආරම්භ කිරීමට පෙර යොදා ගැනේ |
| + | එකතු කිරීම සඳහා |
| - | අඩු කිරීම සඳහා |
| * | වැඩි කිරීම සඳහා |
| / | බෙදීම සඳහා |

### ශ්‍රිත - Function

| ශ්‍රිතය | විස්තරය |
|---|---|
| Sum | කෝෂ පරාසයක එකතුව සෙවීම සඳහා |
| Average | කෝෂ පරාසයක සාමාන්‍යය සෙවීම සඳහා |
| Max | කෝෂ පරාසයක වැඩි ම අගය සෙවීම සඳහා |
| Min | කෝෂ පරාසයක අඩු ම අගය සෙවීම සඳහා |

### ප්‍රස්තාර වර්ග - Charts

වගුගත කර ගත් දත්ත රූප සටහන් මගින් දැක්වීම සඳහා ප්‍රස්තාර යොදා ගැනේ.




- Column - ස්තම්භ ප්‍රස්තාර
- Line - රේඛා ප්‍රස්තාර
- Pie - වට ප්‍රස්තාර
- Bar - තීරු ප්‍රස්තාර
- Area - ක්ෂේත්‍ර ප්‍රස්තාර
- Scatter - විසිරි ප්‍රස්තාර
- Other Charts - අනෙකුත් ප්‍රස්තාර

පැතුරුම්පත් ආශ්‍රිත අභ්‍යාස සඳහා වැඩපොතෙහි 2.1 සිට 2.10 දක්වා ක්‍රියාකාරකම් කරන්න.

## සාරාංශය

- ශ්‍රිත සහ සූත්‍ර යොදා ගනිමින් ගණනය කිරීම් ද, දත්ත තේරීම් ද, ප්‍රස්තාර නිර්මාණය කිරීම ද සඳහා යොදා ගත හැකි තීරු සහ පේළිවලින් සමන්විත ලේඛනයක් පැතුරුම්පතක් ලෙස හැඳින්වේ.
- තීරුවක් සහ පේළියක් එකතු වන ස්ථානය කෝෂයක් යනුවෙන් හැඳින්වේ.
- තීරු ඉංග්‍රීසි A අක්ෂරයෙන් ආරම්භ වන අතර පේළි අංක 1න් ආරම්භ වේ.
- නව ලේඛනයක් ලබා ගැනීම New, විවෘත කිරීම Open, තැන්පත් කිරීම Save, මුද්‍රණය Print, මුද්‍රණ පෙර දසුන Print Preview, පෙර ක්‍රියාව Redo, ආපසු ක්‍රියාව Undo, කැපීම Cut, පිටපත් කිරීම Copy, ඇලවීම Paste, අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ Spelling ආදිය පොදු මෙවලම් ය.
- ශ්‍රිත භාවිතයෙන් ගණනය කිරීම් කරනු ලබයි.
- SUM, AVERAGE, MAX, MIN ආදිය ගණනය කිරීම් සඳහා යොදා ගනු ලබන සරල ශ්‍රිත වේ.
- තීරු ප්‍රස්තාර, ස්තම්භ ප්‍රස්තාර, රේඛා ප්‍රස්තාර, වට ප්‍රස්තාර ආදිය මගින් දත්ත විශ්ලේෂණය සිදු කරනු ලබයි.